# නිර්මාණ Nirmana

## කැළණි විහාරය සහ අම්මා

නිවන් මහට යන පිය ගැට පෙළ නැගලා
බෝධිය වෙහෙර බුදුමැදුරට මල් පුදලා
සුදුවැලි මළුවෙ මා යන යන තැන රැඳිලා
ඔබ හිනැහුණා මගෙ නෙතු මානයෙ ඉඳලා

බුදු පා පහස ලද පින්බර බිමේ ඉඳ
පුන් පෝ දිනට පෙහෙවී සිල් පිරුව සොඳ
අම්මා සමග එක්වී මල් පුදන ලද
කාලය අදත් සිහිවෙයි සිල් සුවඳ මැද

බෝපත් සුළඟ හා කියවන විට පිරිත
මතුරයි කනට ඔබ කිවි ගාථා විරිත
නිවන් මහට පින් පිරුවේ දැන අරුත
අම්මා තුළින් කියවූවෙමි බුදු සිරිත

බඩ ගින්දරට රස මසවුළු පිස කැව්වා
හිත ගින්දරට සෙනෙහස් පිනි දිය පෙව්වා
දිවි තවලමේ මගෙ බරපොදි කර ගැහුවා
ගෙදර බුදුන් වී දස පාරමී පිරුවා

රෝ දුක් නියත යයි බුදුබණ ලෙස සිතුව
අම්මා නික්ම ගියෙ ලෝ දහමට නතුව
පුරා වසර එකොළහකුත් යයි පසුව
එදාටත් වැඩියි අම්මේ ඔබෙ අඩුව

නා මෙනවියන් වැයු වීණා තතක රසේ
නා රජවරුන් හට දෙසූ බණ අදත් ඇසේ
එවන් පුදබිමක සිත මෙත් වැඩුව ලෙසේ
අම්මා නිවන් පුරයට ගිය අයුරු දිසේ

♦ **පද්මා කුරුප්පු** Paris - France

## උපන් දිනේ

ළා හිරු පොකුරු තැවරී තුරු මඩුළු හිස
හෙම්හිට ඇහැ අරින විට මල් දෙනෙත යස
බැලූවලූ මා මෙලොව හෙළිකර සැමගෙ හස
ඒ කල් ඉගිලගොස් එළඹුණි දෙව්සි වස

මල් මුවරදට එන සමනල දන පස්සේ
රිංගා විටින් විට නිල් තුරුගොමු අස්සේ
එළි බැස හොරෙන් ලා හිරිකඩ පොද වැස්සේ
හිනැහුණු ළමා විය දොරගින් පසු බැස්සේ

හැම වප් මසම පස් වෙනිදට එළඹෙන වා
නොදැනිම වගේ වේගෙන් කල් ගතවෙන වා
හැම හෙට දිනම වියපත් බව ගෙන එන වා
දිවියේ අතිර බව ලෝ දම් පවසන වා

පාසැල් මතකයේ රස මුසු තැන් බෝවා
වසරින් වසර හැම දේ හිත් වට ගාවා
මා පිය ගුරුන් මැද හිඳ අම පැන් බීවා
දහ, පහළොව, විස්ස, අද විසි දෙක ආවා

වියපත් වන නමුදු මා හැම උපන් දිනේ
දිවිමග පිය නගමි වඩමින් හදෙහි සෙනේ
හැම මුහුණකම තුටු හසරැළි නැගෙන මෙනේ
සිත් මල් පුබුදුවමි සුවදින් සැම දිනේ

♦ **දුලාංජලී සිරිවර්ධන**
නීති පීඨය - කොළඹ විශ්වවිද්‍යාලය
Sri Lanka

## (රජ්ජු) මාලාවක් මා

උගතිමි ශිල්ප ගුරු දෙගුරුන් දුන් ලෙස ට
මැව්වෙමි සිහින ලද ශිල්පය වපුරන් ට
වැටුනෙන් කැපූ ඉනි බැස යන ගඟ දිය ට
ආවෙමි මෙලෙස බැල මෙහෙයට නොරටුන් ට

ලා හිරු නැගෙන්නට පළමුව අවදි කොට
කා හෝ නොබී දිවයන්නේ සේව යට
ලද අණ පරිදි වෙහෙසෙමි මැෂිමක් ලෙසට
මා ලද ශිල්ප කුමටද මේ මෙහෙ වරට

සීතල හිම වැටෙයි ආයත් හිරු ඇවිලෙ යි
නෙක මල් පිපෙයි සුවඳක් නැත හැඩ පමණ යි
ගෙවිලා අමාවක පුර හඳ නැගෙනු පෙනෙ යි
නිමවෙයි වසන්තය එද හීන මල් පිපෙ යි

රන්මසු සොයා වෙහෙසෙන කල දිවා රැයේ
සුන්දර මැදුරු තුළ දිය වෙයි යොවුන් වියේ
මන්මත් බඹරු රහදෙයි විසිහතර පැයේ
ආදර හැඟුම් ඉපදී හඳ තුළම මියේ

♦ යක්කල - **ආශා චාන්දනී**
Engomi, Nicosia, Cyprus

### සත්‍ය වචනයක්

ක්‍රියාව වචනයට හැරවීම ඉතා ලේසිය.
වචනය ක්‍රියාවට හැරවීම දුෂ්කරය.
♦ රුසියානු ලේඛක මැක්සිම් ගෝර්කි



## මිනිපිරියට ලිපියක්

දි දු ල න දහස් ගණනින් තරු ගුවන් තලේ
සොමිගුණ සඳු විලස නැත ලොව පහන් කළේ
සැමතැන දොර කවුළු හැරියද දවල් කලේ
නැතිතැන බිළිඳු නුඹ අඳුරුය මගේ පැලේ

පිය පස මුතු මිතුන් සත් සමුදුර එතෙර
ගිය පසු හමුවන්ට ගුවනින් දිනක පෙර
සිය ලුම තැන පැලෙහි කිසි මුල්ලක් නොහැර
දි ය නොව කිරි සුවඳ තවමත් ඇත පැතිර

එ න විට පැලට දොර ඇරගෙන නයන පිනා
ය න දත් කැකුළු නැත උතුරණ ටිකිරි සිනා
පැන දුව යන අතර කෙළිමින් නිති මුමුණා
ක න නොවැදෙයි ගැයූ ගී කවි පද අමුණා

නොපැසෙයි බොජුන් නුඹ මුව රිසියන පරිදී
නොඇසෙයි සිනා හඬ පෙර පැල තුළ විහිදී
නොදිසෙයි ළමා සිනමා නිති දුටු පෙරදී
නොසිතෙයි නුඹ නොහැර කිසිවක් කිසි විටදී

ඉකිබිඳ යම් විටෙක රිදිලා හඬන විට
එනවද සනසන්ට සීයා නුඹ වෙතට
දෙනවද රස කැවිලි පැණි සහවා මවට
මොනවද අළුත් කෙළිබඩු ලැබුණේ නුඹට

මුවහැර නොහැර නෙතු සිහිනෙන් හඬන විට
බණවර පිරිත් මතුරනවද නුඹෙ කනට
නිදිබර නොවෙන විට ඔසවාගෙන කරට
රසබර කවි කතා කියවන වද නුඹට

බ ඳ බැඳගෙන මෙහිදි නුඹ සරසා නිතින
න ඳ වුණු නුඹගෙ සුළුමව පෙම්බර හදින
බොඳ වීගෙන යයිද නුඹෙ මතකය වෙතින
මැ ද පිය නෑ සියන් සුරතල් වෙන ගමන

♦ **වෛද්‍ය උපාලි අබේසිරි**
Middx UK

## සැරද ලක්මව !

යුද බිය හතර අත නිරතුරු පැතිරෙන් නේ
ගංවතුරකින් මායා රට ගිලගන් නේ
නැතිබැරිකමයි මුළු රට තුළ රැව් දෙන් නේ
මගෙ ලක්මවට ඇයි මේ ලෙස දුක් දෙන් නේ

රාවණ රජු දවස යසිසුරු තිබුණේ ය
පැරකුම් රජු සහල් පිටරට යැව්වේ ය
පෙර අප රටේ නෙක සව්සිරි පිරුණේ ය
ආලකමන්දාව මේ යයි සිතුණේ ය

නිරතුරු පරසතුරු උවදුරු ආ හින්දා
සිංහළ අපේ තිබූ ඔද තෙද සැම සින්දා
සිහලුන් පසුවුණේ නෙතු කඳුලැලි රන්දා
මේ දුක් කඳුළු කවදා වියැකෙද මන්දා

තුන් සිංහලයෙ සාමයෙ මල් පිබි දේවා
රන්වන් කරල් මඳ සුළඟේ නැල වේවා
ගෙන් ගෙට සෙනෙහසේ සුදු මල් පිබි දේවා
සව් සිරි පිරී මගෙ ලක්මව සැර දේවා!

♦ **මැණිකේ සූරියාරච්චි**
වටපුළුව මහනුවර Sri Lanka





## අයිපල් කුලුණ ද? සීගිරිය ද?

පත පොත රූපවාහිනියෙන් නෙත ගැටුණ
ලොව ඇති පුදුමයක් විදියට පිළි ගැනුණ
පැරිසියෙ සුන්දරත්වය ලොවටම කියන
අද මම ඇසින් දුටුවෙමි අයිපල් කුලුණ

පුදුමය උපදවන දේවල් තව ලෝකේ
තිබුණත් ඒක නොව මට ඇතිවන සෝකේ
ගත් කල සීගිරිය අයිපල් යන මෙ දෙකේ
වැඩියෙන් පුදුම වියයුතු කෝකද මේකේ

♦ **සරත් එල්ලාවල** Paris - France

## ලංකාවිත්ති මතක

එක්සත් දනව් තේම්ස්වල සිටින කල
ලංකාවිත්ති ගරුකරමින් සිරිත හෙළ
ඇරඹුණු හැටි දනිමි මම කළ නොහැකි මිළ
ඒ ගැන අදහසක් මතුවිය මසිත තුළ

මවත් මව්බිමත් වැඩියෙන් සග සැපට
සුවදෙයි කියන සකුගය පෙරලා හෙළට
දවසක් කතුතුමා ආ විට පන් සලට
පැවසූ හැටි අදත් නැග එයි මසිත යට

මැතක තැපැලෙන් පත්තර දෙකක් ලැබී
සතුටක් දැනුණි එහි මගෙ පැදි පෙළක් තිබී
ඉන් පණ ලැබුණි බැලුමට කවි සිතට එබී
මහතුනි! අන් ලිපිද අද යුගයටම හොබී

දැන් බොහො දුරට යුදගිනි ඇති නමුදු නිවී
තැන තැන පුපුරවා හෙණ ගත් පිරිස අවී
නැති බැරි අහිංසකයින් තොරකරති දිවී
එනමුදු මිහිඳු සිතුවිලි ඇත ඇතිව සවී

පිරිසක් පොලේ යති දරුවන් වඩා ගතී
පැජරෝ මග දමා දැන් ගැල්වලින් යතී
පෙර බොහො දනන්ගෙන් අපමණ ලැබූ තුතී
ඒ ඒ අයම තම බලතල නසා ගතී

මේ ඈ විවිධ තොරතුරු ඇති නමුදු පිරී
ඒ හැම ලියන එක එතරම් නොමැත හරී
ලංකාවිත්ති පත තව තව ලබා දිරී
සඳසේ දිලේවා! පැවූ සයුරෙ කිරී

ත්‍රිපිටකවේදී ශාස්ත්‍රපති
♦ **මිගස්තැන්නේ රතනජෝති හිමි**
සුනන්දාරාමය
ගම්පහ Sri Lanka

## ඔබ කැන්දා මා යනවා!

අවුරුදු හතක් ඇයහට මා පෙම් බැන්දා
ඇයගේ හදෙහි සෙනෙහස මා බෝ වින්දා
නිතරම අසයි කවදද යන්නේ කැන්දා
මල්සර නැකත ආ දින යමි ඔබ කැන්දා

දෙදහස් නවයෙ ඇය කැන්දා මා යනවා
ආසිරි මැදින් මල් යහනක රඳ වනවා
සිරිකත මගේ නිවසට එන සෙය දනවා
පිරිවර සමග මා ඇය කැන්දා එනවා

හදනෙමි කැදැල්ලක් මම නෙක දුක් විඳලා
තනනෙමි පැටව් ඇය හා මම කූඩු වෙලා
පොඩි දරු පවුල හා ඉන් ගෙය ඔප වැටිලා
රකිනෙමි ඇය මගේ පණ දෙවැනිව සිතලා

ඔබගේ සිතුම් පැතුමන් හොඳහැටි දනිමී
කිසි දින ඔබට දුක් කරදරයක් නොදෙමී
පසුවන කාලෙ ඔබ සමගින් විඳ ගනිමී
මාගේ පැතුම ඔබ බිරිඳව කර ගනිමී

♦ **කුසුම්සිරි ද සිල්වා**
Nicosia Cyprus



## රුව

විසි කරපන් අම්මේ.....
ඔය කුරුළු කැත්ත අහකට....
ඌ ඔහෙ ගියාදෙන්.....
අපි දරුවා හදා ගමු......!

දෙවට දිගේ හින්දි ගීත රැව් දුන්නා
මල් පත්තර සමනළයින්
සුදු බිත්තියෙ වැහුවා
ෂාරුක් ඛාන්ව නංගි හීනෙන් හෙව්වා
කුරුළු හේනේ උන් රහපාලා තිබුණා

නිසංසලා සුරතල් අපෙ පොඩි නැගණී
නිකම් බලා සිටියත් කෝටියක් වටී
නෙතට වතට බැල්මට උවමන් නොමැතී
මෙතරම් රුව නැගුණේ
කරුමෙටදැයි නැගණී

♦ **සුරේන්ද්‍ර මොළගොඩ**
ගල්ලෑල්ලගම Sri Lanka

## අහේණිය

පෙරහැරක් වගෙ පිරිවරක්
හිටපු මහගෙදරක්
වල්වැදී - යට ලී පුරා
අම්බලම්පාළුවෝ වැහි වැහැලා

මහකැලේ දෙවනත් කරපු උළමා
වහලෙ උඩටම ඇවිත් හඬනවා
පැදුරු ආනෙන් නයෙක් හැව ඇරලා

දහදොළොස් දෙනෙකුට බතක් හදලා
ලිපත් අමනාපෙයෙන් පසුවෙනවා
සුනඛයන්ට නවාතැන් දීලා

♦ **මහින්ද ප්‍රසාද් මස්ඉඹුල**
ගොඩකවෙල Sri Lanka



## නොඉවසිල්ල

කැලි කැපිය හැකි තරම්
කට්ට කළුවරේ
බංකර නිවහනට වී
සිටිමි මම සෝදිසියෙන්
විටෙකින් ඇසෙයි පා හඬක්
සතුරෙක් ද? මිතුරෙක් ද?
නොදනිමි.....
ගිනි අවිය තව තවත්
ඉබේ දැතට හිරවෙද්දි
සීතල පස්ගෝනි අතරින්
දෙනෙත පාකරමි කළුවරට
නැත....
කිසිත් නැත... කිසිවෙකු නැත...
සෙබල මිතුරන්ගේ
හුස්ම පොදක ජීවය දකින්න
හිරුදෙව් නැගෙන කල්
ජනිත වෙන නොඉවසිල්ල මිස
බයක් නම් අහලකවත් නැත

♦ **එරංගා පෙරේරා**
Netherlands

## දරු සෙනෙහසේ මහිම !

සහනය ලබා දෙන්නට රෝ දුකින් මට
පොඩිදුව මා කැටුව ගොස් රෝහල වෙතට
නවතා අවුත් හැමදා මා බලන් නට
දුවගෙන ගියා මව් සෙනෙහස පෙරටු කොට

නවතා සිහිති දරුවන් හිතවත් තැනක
රෝහල වෙත ගියේ ඇය මා ගන්න දැක
ඇය කළ සටන මගෙ ජීවය දෙන්න රැක
සිහිවෙන විට ඉතිර යයි මා හදේ දුක

මා රෝහලේ බව දැනගෙන නැගණිය ගෙන්
මව් සෙනෙහසින් හා සපිරුණු කුළුණු මෙතින්
සැතපුම් දහස් ගණනක් සිටි නමුදු දුරින්
ලොකු දුව පිටත්විය වැඩපළ අතැර සැනින්

මුළු දහවලම මා ළඟ නැවතී ඉන්න
බලධරයින් හමුව අවසර ලබා ගෙන
ලොකු දුව පැමිණ එහි හැම දා උදැසන
උවටැන් කළ මට මව් කෙනෙකුන් ලෙසින

හිමිවරු පස්නමක් නිවසට වැඩම වලා
දන් පැන් පිරිකරත් සැදැහෙන් පුද කරලා
පිරිතෙන් දහම් දෙසුමේන් සෙත් සළ සාලා
පසුදා ඇය ගියා කැලිපෝනියා බලා

එ අතර පුතෙක් ගොස් සිරිලක් මවුන් වෙත
වෙදැදුරු කෙනෙකු හට සැලකර මේ පුවත
ලැබගෙන නොයෙක් ඔසු ගෙන දෙන සුවය සෙත
සකසා ගෙනතැ දුන්නා සෙනෙහසින් සිත

විශ්‍රාම ලත් විදුහල්පතිනිය
♦ **ප්‍රේමා අදිකාරි**
Morden, Surrey, UK